# දැන්වීමයි

## හෝමියෝපති වෛද්‍ය සභාවේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ යටතේ පවත්වාගෙන යනු ලබන හෝමියෝපති වෛද්‍ය සභාවේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## වෛද්‍ය නිලධාරී තනතුර

**01. තනතුර** : හෝමියෝපති වෛද්‍ය නිලධාරී

**02. පත්වීමේ ස්වභාවය** : ස්ථිරය, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**03. වැටුප් ක්‍රමය** : සේවා ගණයට අදළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

MM 1-1-2016 රු. (53,175 - 10X1375-15X1910-95575/=)

**04. අවශ්‍ය සුදුසුකම්** : ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් වසර පහ හමාරකට නොඅඩු උපාධි පාඨමාලාවක් හැදෑරීමෙන් පසු ලබාගත් හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබාතිබීම

**හෝ**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරකට නොඅඩු පූර්ණ කාලීන හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හා ඉන් පසුව වසර 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබාතිබීම.

සහ

අවම වශයෙන් වසරක සීමාවාසික පුහුණුවක් ලබා තිබීම.

හෝමියෝපති වෛද්‍යවරයෙකු වශයෙන් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

අවම වශයෙන් එක් වසරක දේශීය හෝ විදේශීය රෝහලක, ආයතනයක හෝ සායනයක වෘත්තිමය (වෛද්‍ය චිකිත්සා අංශයෙන්) පළපුරුද්දක් ලබා තිබීම. (ප්‍රතිකාර කළ රෝගීන්ගේ නාම ලේඛනය සහ එම ආයතනයේ සේවය කළ බවට අදළ ආයතනයේ නිල මුද්‍රාව සහිත ආයතන ප්‍රධානීන්ගෙන් හෝ පෞද්ගලිකව පවත්වාගෙන ගිය ආයතනයක් නම් අදළ ආයතනය පත්වාගෙන යනු ලැබූ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය මගින් සනාථ කළ යුතුය.)

**05. වයස් සීමාව** : අවු. 25 නොඅඩු විය යුතු අතර, අවු. 50 ට නොවැඩි විය යුතුය.

**06. වෙනත්** : සෑම ඉල්ලුම්කරුවෙක්ම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත්වීම් බලධාරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම් වූ කුසලතා අනුපිළිවෙළට අනුව බඳවා ගනු ලැබේ.

**සුදුසුකම් ලබන දිනය** : සේවයට / තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙස පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 4, 5 හා 6 යන වගන්තිවල සඳහන් අවශ්‍ය සුදුසුකනම් අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

**අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය** : අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සෑම ආකාරයකින්ම සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත් කළ යුතු අතර, 4 හා 5 යන වගන්තිවලින් දැක්වෙන සුදුසුකම් සනාථ කිරීම සඳහා නිසි පරිදි සහතික කරන ලද අධ්‍යාපන හා අනෙකුත් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.

## කළමනාකරණ සහකාර තනතුර

**01. තනතුර** : කළමනාකකරණ සහකාර - III ශ්‍රේණිය

**02. පත්වීමේ ස්වභාවය** : ස්ථිරය, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**03. වැටුප් ක්‍රමය** : සේවා ගණයට අදළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

MA 1-1-2016 රු. (27,910-10X300-7X350-4X495-20X660-48,540/=)

**04. බාහිර අයදුම්කරුවන් :**

**අධ්‍යාපන :** (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි

iii. ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (03), (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**වෙනත් සුදුසුකම්** : පරිගණක වදන් සැකසුම පිළිබඳ මූලික දැනුම

**05. අභ්‍යන්තර අයදුම්කරුවන්** : (අ) ප්‍රාථමික ශ්‍රේණියේ / ශිල්පීය නොවන සහ අර්ධ ශිල්පීය සේවා ගණයන්හි පහත සඳහන් සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්

i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි

iii. ගණිතය

යන විෂයන් ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) සමත්ව තිබිය යුතු අතර, ඉන් විෂයන් තුනකටවත් සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

(පරිගණක වැදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම. හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවක් අතිරේක සුදුසුකම් වශයෙන් සලකා බලනු ඇත.)

(ඇ) සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමකට යටත් පිරිසෙන් අවුරුදු පහ (05) ක අඛණ්ඩව සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**06. වයස් සීමාව** : අවු. 18 ට නොඅඩු විය යුතු අතර, අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදළ නොවේ.

**07. වෙනත්** : සෑම ඉල්ලුම්කුවෙක්ම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබදු අසත්‍ය වැරදි තොරතුරක් බඳවා ගැනිමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

පත්වීම් බලධාරීයා වනුයේ හෝමියෝපති වෛද්‍ය සභාව වන අතර, එහි තීරණය අවසාන තීරණය වේ.

ඔබ විසින්ම සකස් කර ගන්නා ලද සියලු කරුණු ඇතුළත් අයදුම්පත්‍රයක් **2021 මාර්තු 25** හෝ එදිනට පෙර ලැබෙන සේ.

**ලේඛකාධිකාරී,**
**හෝමියෝපති වෛද්‍ය සභාව,**
**94, ෂෙල්ටන් ජයසිංහ මාවත,**
**වැලිසර, රාගම.**

යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

**එම්. ඒ. පෙරේරා**
**ලේඛකාධිකාරී,**
**හෝමියෝපති වෛද්‍ය සභාව.**